


**මෙම සමාගමේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පී (ඩීසල් වැද්දුම්) 11වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** සහකාර ඉංජිනේරු හා තාක්ෂණ නිළධාරීන් යටතේ සියළු විදුලි උත්පාදක යන්ත්‍ර හා ඒ හා සම්බන්ධ අදාල යාන්ත්‍රික උපකරණවල සේවා හා නඩත්තු කටයුතු කිරීම.

**රැකියාවේ වගකීම් :**

1 සියළු විදුලි උත්පාදක යන්ත්‍ර, ඒ හා සම්බන්දිත පද්ධති හා අදාල යාන්ත්‍රික උපකරණ ආශ්‍රිත හදිසි ක්‍රියා විරහිත වීම් හා, බිඳ වැටීම් යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කිරීම.

11 අවශ්‍ය වූ විටක ඉහත ක්ෂේත්‍ර වපසරියේ සවි කිරීම් හෝ නවීකරණ කටයුතු කිරීම.

111 කටුනායක, මත්තල, සහ පිදුරුතලාගල පිහිටුවා ඇති විදුලි උත්පාදක යන්ත්‍ර වල සේවා කටයුතු හා අළුත් වැඩියා කටයුතු සිදු කිරීම.

1V විදුලි උත්පාදක යන්ත්‍ර, ඒ හා සම්බන්ධ අදාළ යාන්ත්‍රික උපකරණ වලට අදාලව ක්‍රියාකරවීම් හා නඩත්තු කටයුතු සඳහා දත්ත වාර්තා පවත්වා ගෙන යාම.

V ඉහල නිළධාරීන් විසින් සපයා දෙනු ලබන ගුවන් තොටුපොල පරිශ්‍රය තුල ඇති විදුලි උත්පාදක යන්ත්‍ර ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ කාර්යය සටහන් යාවත්කාලීන කරමින් දෛනික පරීක්ෂාවේ යෙදවීම.

VI දත්ත වාර්තා රැස් කිරීමෙන් හා නිරීක්ෂණ කටයුතු තුලින් ඉහල නිළධාරීන්ගේ පරීක්ෂණ කටයුතු සඳහා සහාය වීම.

VII විදුලි උත්පාදක යන්ත්‍ර උපකරණ හා ඒ අවට පරිසරය සතුටුදායක අයුරින් පවත්වා ගෙන යාම.

VIII ගුවන් තොටුපොල නඩත්තු කටයුතු ක්‍රියාවලිය හා සම්බන්ධ ගැටළු අවස්ථාවන්හිදී සක්‍රිය ලෙස ඒ සඳහා දායක වීම.

01. **සුදුසුකම් :** (අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ වෘත්තීය ආධුනිකත්ව සහතිකයක් ඩීසල් වැද්දුම් ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

නැතහොත්

දැවුරුද්දකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් විසින් නිකුත් කරනු ලැබූ වෘත්තීය සහතිකයක් ඩීසල් වැද්දුම් ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

සහ

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාලසීමාවද ඇතුලත්ව සිව් වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**පොදු කරුණු :-**

**ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.**

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත්‍රයක් පහත සඳහන් ලිපිනයට **ලියාපදිංචි තැපැලෙන්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුවේ.

**පාඨමාලා සහතික හා සේවා සහතික වල ජායා පිටපත් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සියළුම අයදුම්පත් පහත සඳහන් ලිපිනයට 2018 ජුනි මස 22 වන දිනට පෙර ලැබීමට සලස්වන්න.**

**සභාපති**

**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**

**කටුනායක**




**මෙම සමාගමේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# කර්මික ශිල්පී (වායු සමීකරණ)11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** සියළුම වායු සමීකරණ යන්ත්‍ර හා පද්ධති වල නඩත්තු කටයුතු, අළුත් වැඩියාවන් හා සවි කිරීම් අධීක්ෂණ නිළධාරීන් යටතේ සදු කිරීම.

**රැකියාවේ වගකීම්** :

1 වායුසමීකරණ යන්ත්‍රාගාර, යන්ත්‍ර සහ පද්ධති වල (විදුලි පාලක උපකරණ ඇතුළුව) පෙර ලැයිස්තු ගත සේවා සහ පූර්ව නඩත්තු කටයුතු අධීක්ෂණ නිළධාරීන්ගේ උපදෙස් හා අධීක්ෂණ යටතේ පවත්වාගෙන යාම හා පවත්නා විශේෂිත තත්ත්වයන් පිළිබඳව නිළධාරීන් දැනුවත් කිරීම.

11 ඉහත සඳහන් පද්ධති වල හදිසි බිඳවැටීම් (විදුලි පාලක උපකරණ ඇතුළුව) සඳහා ක්ෂණිකව සහභාගි වී ඒවා නිවැරදි කිරීම හා ඒ සම්බන්ධ අදාළ අංශ සමග මනා සන්නිවේදනයකින් හා සහයෝගයෙන් කටයුතු කිරීම.

111 වායු සමීකරණ යන්ත්‍රාගාර, යන්ත්‍ර සහ පද්ධති, වාය සමන ජල පොම්ප වායු සමන ජලනල සහ උපකරණ නිසි අවධායනයකින් හා අධීක්ෂණයකින්, මනා ක්‍රියාකාරීත්වයෙන් පවත්වා ගෙන යාම.

1V ඉහත පද්ධති පෙර ලැයිස්තු ගත කිරීම් කළ යුතු අතර, අදාළ වාර්ථා නිසි ලෙස පවත්වා ගෙන යාම.

V අදාළ පද්ධතිවල දත්ත හා විශ්ලේෂණයන් ලබා ගැනීමට සහ වාර්තා ගත කිරීම් සිදු කිරීම සඳහා සහාය වීම.

VI අනෙකුත් වායු සමීකරණ කාර්මිකයින්ගේ කටයුතු සඳහාද අවශ්‍ය අවස්ථාවන්වලදී සහාය දැක්විය යුතු අතර අධීක්ෂණ නිළධාරියා විසින් කලින් කලට පවරනු ලබන අනෙකුත් සේවා කටයුතු ඉටු කිරීම.

V11 හදිසි ආපදාකාර් අවස්ථාවන්වලදී ගුවන් තොටුපළ නඩත්තු කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

**සුදුසුකම් :**

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ වෘත්තිය ආධුනිකත්ව සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

නැතහොත්

දැවුරුද්දකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් විසින් නිකුත් කරනු ලැබූ වෘත්තිය සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

සහ

(ආ) ආධුනිකත්ව කාලසීමාව හා පාඨමාලා කාලසීමාවද ඇතුලත්ව සිව් වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත්‍රයක් පහත සඳහන් ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදු**ම්කරන තනතුර** සඳහන් කළ යුතුවේ.

**පාඨමාලා සහතික හා සේවා සහතික වල ඡායා පිටපත් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සියළුම අයදුම්පත් පහත සඳහන් ලිපිනයට 2018 ජූනි මස 22 වන දිනට පෙර ලැබීමට සළස්වන්න.**

**සභාපති**

**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**

**කටුනායක**